**දේශීය ආදායම් දිරි දීමනා අරමුදල - 2014**

**------------------------------------------**

දේශීය ආදායම් දිරි දීමනා අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශේෂ පත්‍රය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරි වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**--------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දිරි දීමනා අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි

මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෙම අරමුදල සඳහා ආදායම් ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) නිවාස ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ දෙන ලද ණය සහ අයකිරීම් සටහන් කිරීමට ලෙජර ගිණුම් භාවිතා කර නොතිබුණු බැවින් එම කාර්යයේ නිරවද්‍යතාවය තහවුරු නොවිනි.

(ඇ) නිවාස ප්‍රතිලාභ අරමුදලේ සාමාජිකයින් වෙත ලබාදුන් ණය ශේෂය වූ රු.15,999,726 සහ ඒ වෙනුවෙන් බැංකුවේ තැන්පත් කර ඇති රු.15,020,495 ක මුදලේ ශේෂය නිවාස ප්‍රතිලාභ අරමුදල ලෙස ජංගම වත්කම් යටතේ පෙන්නුම් කර තිබූ අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී ණයගැති ශේෂය මුදල් හා ආසන්න මුදල් ලෙස සලකා තිබුණි.

## 2.3 දිරි දීමනා අරමුදල නැවත ක්‍රියාත්මක කිරීම

2006 වර්ෂයේ සිට දිරි දීමනා ගෙවීම වැය ශීර්ෂ ප්‍රතිපාදන මගින් කිරීම හේතුවෙන් දේශීය ආදායම් දිරිදීමනා අරමුදල සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක අරමුදලක් නොවීය.ඒ නිසා දිරිදීමනා අරමුදල යටතේ පැවති එකතුව රු.5,361,329 ක් වූ ස්ථාවර වත්කම්වලින් රු.5,109,075ක ඉඩම් හා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පවරා තිබුණු අතර අරමුදලේ කාර්යයන් සඳහා භාවිතා නොකරන රු.252,255ක් වූ කාර්යාල උපකරණ හා ක්‍රීඩා භාණ්ඩ දෙපාර්තමේන්තුවට පැවරීමට කටයුතු කර නොතිබුණි.

එහෙත්, එම අරමුදල නැවත ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් කරන ලද ඉල්ලීමට අනුව එම අරමුදල නැවත ක්‍රියාත්මක කිරීමට 2014 ඔක්තෝබර් 13 දිනැති ලිපිය මගින් භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලැබී තිබුණි.

## 3. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින්වර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) නිවාස ප්‍රතිලාභ ක්‍රමයේ ණය පාලනය
(ආ) ස්ථාවර වත්කම් කළමනාකරණය